දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2/2005

මගේ අංකය: සසෞ/12/4-2005

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය
දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

2005.04.28

සියළුම පළාත් අධ්‍යක්ෂවරු සහ
සියළුම පශු වෛද්‍යවරුන් වෙත,

## <u>වසු පැටවුන්ගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීම සඳහා</u>
## <u>පණුවන් නැසීම (පණුවන් නැති කරන ඖෂධ යොදා ගැනීම)</u>

පණු රෝග වසංගතය වසු පැටවුනගේ මරණයට හේතු වන පොදු සිද්ධියක් ඔබට පත්වි ඇති අතර, විද්‍යාත්මකව තහවුරු කර ඇති අන්දමින් පණුවන් සඳහා නියමිත ඖෂධ ලබාදීම මගින් මෙය වලක්වා ගත හැකිවේ. මනා සහ සුක්ෂම පරිසරයට අනුව මෙම විවිධ පණු රෝගයන්ගේ පැවැත්ම හේතුවෙන් පණුවන් නැසිම කෘෂි දේශගුණික කලාප සහ සත්ව පාලන ක්‍රම මත රඳා පවතී.

පණුවන් මර්ධනය කිරිම සඳහා වන වැඩසටහන 2005 දී හඳුන්වාදීමට සැලසුම් තිබෙන අතර, අනාගතය සඳහා වඩා විශේෂිත ක්‍රමයක් සැකසීම පිණිස විද්‍යාත්මක අධ්‍යයනයක් ඊට ඇතුලත් වේ. මෙම වැඩසටහන මගින් 2005 වසර තුළදී වසු පැටව් 30,000 (කෘතිම සිංචන ක්‍රමයෙන් උපන් පැටව්) කේන්ද්‍රිය කරගෙන තිබේ. පැටව් තේරීම ගොවිපලේ තත්වය මත පදනම් වන අතර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබෙන ගොවිපල් වලට ප්‍රමුඛතාවය දෙනු ඇත. පරපෝෂිතයන්ගෙන් බෝවෙන රෝගවලට බඳුන් විය හැකි කෘතිම සිංචන කළ වසු පැටවුනට එමගින් ප්‍රමුඛතාවය ලැබෙනු ඇත. තෝරාගත් ඖෂධ වල සාර්ථකත්වය ඖෂධ ලබාදී සති දෙකක කාලයකට පසුව සතුන්ගේ අපද්‍රව්‍ය සාම්පලයක් පරීක්ෂා කිරීමෙන් විමර්ශණය කරනු ඇත.

පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් බලාපොරොත්තු වන කටයුතු :

1. වැඩසටහනට පැටවුන් තේරීම.
2. සතුන්ගේ අපද්‍රව්‍ය සාම්පල බැහැර කිරීම සඳහ පණුවන් නසන ඖෂධ ලබාදීම.
3. ඖෂධ ලබාදී සති දෙකක කාලයකට පසුව පණුවන් නැසීමේ පසු සාම්පලයන් එකතු කිරීම.
4. වසු පැටවුන්ට (දෙවන සහ තුන්වන වඩිය) පණුවන් නැසීමේ ඖෂධ ලබාදීම.
5. සතුන්ගේ දෙවන සහ තුන්වන අපද්‍රව්‍ය සම්පලයන් රැස් කිරීම.
6. වැඩසටහනට අදාල සියළුම වාර්තා පවත්වාගෙන යාම.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී පහතින් දැක්වෙන පහසුකම් ලබා දෙනු ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | දිරි දීමනා | - | පණුවන් නැසීමේ ඖෂධ ලබාදීම හෝ සාම්පල රැස් කිරීමට වසු පැටවුන් පස් දෙනෙකුන් රැක බලා ගැනීමට දින 1/2ක් දිරි දීමනා. |
| 2. | ඉන්ධන හා දීමනා | - | ඉන්ධන දීමනා නියමාකාරයෙන් අවශ්‍ය වන්නාවූ ප්‍රමාණය මත වෙනස් වනු ඇත. ගමන් වාර 05කට ඩීසල් ලීටර් 10 ක් යොදා ගත යුතුය. |

සත්ව සෞඛ්‍ය අධ්‍යක්ෂගේ තාක්ෂණික් උපදෙස් මත ගව පට්ටි පාලන ග්‍රාමීය මධ්‍යස්ථාන කේන්ද්‍ර කොට ගෙන පළාත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ සත්ව සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය මගින් වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. බස්නාහිර, දකුණ, වයඹ, උතුරු මැද සහ උතුරු නැගෙනහිර පළාත්වල පිහිටි අදාළ පශු විමර්ශන නිළධාරීන් මෙම කටයුතු සම්බන්ධීකරණය කරනු ඇත. මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වලදී සත්ව සෞඛ්‍ය අංශයේ නිළධාරීන් විසින් එම කටයුතු සම්බන්ධීකරණය කරනු ඇත.

අ/ක, එස්.කේ.ආර්.අමරසේකර
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ, ප.ප/නී.සැ./ස.සෞ./ස.අ./
මූ.ස.සං./පාලන/ගිණුම්